## සමෘද්ධි ක්ෂුද්‍ර මූල්‍ය ලිපිද්‍රව්‍ය චක්‍රීය අරමුදලේ ගනුදෙනු පිළිබඳ වාර්තාව - 2020-2022

-----------------------------------------------------------------------------------------------

සමෘද්ධි ක්ෂුද්‍ර මූල්‍ය ලිපිද්‍රව්‍ය චක්‍රීය අරමුදලේ 2020 ජනවාරි 01 දින සිට 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂ 3 ක කාල පරිච්ඡේදය සඳහා වූ මෙහෙයුම් කටයුතු පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ ඇතුළත් වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව, සෑම විගණනය කරනු ලබන අස්ථිත්‍යයක් විසින්ම එම අස්ථිත්‍ය සම්බන්ධව වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය. එම පනතේ 16(2) වගන්තිය ප්‍රකාරව, සෑම විගණනය කරනු ලබන අස්ථිත්‍යයක් සම්බන්ධයෙන් වූ වාර්ෂික මූල්‍ය ප්‍රකාශන, රීති මඟින් දක්වනු ලැබිය හැකි පරිදි වන කාලසීමාවක් තුළ එම අස්ථිත්‍යවල වාර්ෂික කාර්යසාධන වාර්තා ද සමඟ ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා විසින් විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතුය. එම පනතේ 38(1) (ඇ) වගන්තිය ප්‍රකාරව, වාර්ෂික වාර්තා සහ වෙනත් මූල්‍ය ප්‍රකාශන අවශ්‍ය වේලාවන් ඇතුළත පිළියෙල කිරීමට සිදුවන බව සහතික විය යුතු අතර ඊට අමතරව විගණනය කරනු ලබන අස්ථිත්‍යයට අදාළ වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා වගබලා ගනු ලැබිය යුතුය.

### 1.3 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 15 ඡේදයේ ඇතුළත් මුදල් රෙගුලාසි 877(2) ඈ ප්‍රකාරව අරමුදලේ මූල්‍ය ප්‍රකාශන ගිණුම් වර්ෂය අවසන්වී මාස 02 ක් තුළ කාර්යසාධන වාර්තාවක්ද සමඟ මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවට පිටපතක් සහිතව විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතු වුවද, 2020, 2021 හා 2022 වර්ෂයන්හි මූල්‍ය ප්‍රකාශන මෙම වාර්තාවේ දින වන විටත් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

### 1.4 2019 දෙසැම්බර් 31 දිනට පැවති වත්කම් හා වගකීම්වල තත්ත්වය

අරමුදල විසින් අවසන් වරට පිළියෙල කරන ලද 2019 දෙසැම්බර් 31 දිනට වූ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වත්කම් ,බැරකම් , ආදායම් හා වියදම් පිළිබඳ විස්තර පහත දැක්වේ.

| මූල්‍ය ප්‍රකාශන අයිතමය | වටිනාකම |
|---|---|
| | රු. |
| <u>වත්කම්</u> | |
| ජංගම නොවන වත්කම් | 33,198,564 |
| ජංගම වත්කම් | 134,519,860 |
| | -------------- |
| **මුළු වත්කම්** | **167,718,424** |
| | ======== |
| <u>ස්කන්ධය හා වගකීම්</u> | |
| ස්කන්ධය | 144,867,690 |
| <u>වගකීම්</u> | |
| ජංගම බැරකම් | 22,850,734 |
| | --------------- |
| **මුළු බැරකම්** | **167,718,424** |
| | ========= |
| මුළු ආදායම | 13,336,957 |
| මුළු වියදම | 2,318,911 |
| | --------------- |
| **අතිරික්තය** | **11,018,046** |
| | ======= |

## 2. විගණන නිරීක්ෂණ

## 2.1 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| (i) මුදල් රෙගුලාසි 144 | ගබඩා ද්‍රව්‍ය නිකුත් කිරීම ගණකාධිකාරිවර යාගේ අධීක්ෂණය හා අනුමැතිය යටතේ සිදුවිය යුතු | බැංකු ලිපිද්‍රව්‍ය ගබඩාවේ ඇත්තේ ක්ෂුද්‍ර මූල්‍ය අංශයේ ලිපිද්‍රව්‍ය චක්‍රීය අරමුදල යටතේ මිලදී ගැනීම් කරන ලද ලිපිද්‍රව්‍ය පමණක් බැවින් එම | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුයි. |

| | | | | |
|---|---|---|---|---|
| | | වුවද ඒ අනුව කටයුතු කර නොතිබුණි. | ගබඩාව 2019 මාර්තු 13 ප්‍රධාන ගණකාධිකාරිවරයා විසින් අධ්‍යක්ෂ ජනරාල් වරයාගේ අනුමැතියෙන් ක්ෂුද්‍ර මූල්‍ය අංශය වෙත පවරා ඇත. | |
| (ii) | මුදල් රෙගුලාසි 189 සහ 486 | 2022 දෙසැම්බර් මස බැංකු සැසදුම් ප්‍රකාශනය අනුව 2017 ජනවාරි 30 සිට 2022 අගෝස්තු 29 දක්වා තැන්පත් කල නමුත් උපලබ්ධි නොවූ වටිනාකම රු. 349,152 ක් වූ චෙක්පත් 14 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | 2017 වර්ෂයට පෙර සිට අත පසු වීමකින් ලිපිද්‍රව්‍ය චක්‍රීය අරමුදලට අදාල චෙක්පත් දෙපාර්තමේන්තුවේ වෙනත් ජංගම ගිණුමකට බැර කර ඇති අතර ඒ සම්බන්ධව අදාල බැංකුව දැනුවත් කර ඉදිරියේදී මෙම චෙක්පත් හඳුනාගෙන නිවැරදි කිරීමට කටයුතු කරනු ඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුයි. |
| (iii) | මුදල්රෙගුලාසි 396 | 2016 ඔක්තෝබර් 05 දින සිට 2019 ජුනි 26 දින දක්වා නිකුත් කළ නමුත් නිශ්කාශනය නොවූ රු. 928,675 ක් වු චෙක්පත් 10 ක් සම්බන්ධව මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | 2016 ඔක්තෝබර් 05 දින සිට 2019 ජුනි 26 තෙක් මෙම චෙක්පත් දිස්ත්‍රික් කාර්යාල හෝ වෙනත් ප්‍රාදේශීය කාර්යාල වලින් ලිපිද්‍රව්‍ය චක්‍රීය අරමුදලට සෘජුවම තැන්පත් කළ චෙක්පත් වන අතර මේ වන තෙක් මෙම චෙක්පත් සම්බන්ධයෙන් තොරතුරු සොයා ගැනීමට නොහැකි වී ඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුයි. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 ප්‍රසම්පාදනය

| | විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4 ඡේදය ප්‍රකාරව ප්‍රසම්පාදනය ආරම්භයේ සිට අවසන් වනතුරු එක් එක් ප්‍රසම්පාදන ක්‍රියාවන්හි පියවර ක්‍රමානුකූලව විස්තර කරන පරිදි ප්‍රසම්පාදන සැලැස්ම සකස් කල යුතු වුවත් 2021 හා 2022 වර්ෂ තුළ සිදු කරන ලද පිළිවෙලින් රු.107,321,465 හා රු. 121,921,981 ක් වූ බැංකු ලිපිද්‍රව්‍ය ප්‍රසම්පාදනය සම්බන්ධයෙන් ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | 2021 හා 2022 වර්ෂ වලට අදාල වන ප්‍රසම්පාදන සැලැස්මට ඇතුලත් කර නොමැති බව හා ඉදිරියේදී ඇස්තමේන්තු වටිනාකම් ඇතුලත් කිරීමට කටයුතු කරන බව. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුව කටයුතු කළ යුතුයි. |
| (ආ) | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.2.2 ඡේදය ප්‍රකාරව පුවත්පත් දැන්වීම් පලකොට ජාතික වශයෙන් තරඟකාරී ලංසු කැඳවීමට කටයුතු නොකොට වෙළඳපොල මිල සැදහුම් ක්‍රමය යටතේ එකම සැපයුම්කරුගෙන් එකම ලිපිද්‍රව්‍ය අවස්ථා කිහිපයකදී විවිධ මිල ගණන් යටතේද එකම ලිපිද්‍රව්‍ය විවිධ සැපයුම්කරුවන්ගෙන්ද මිලදී ගෙන තිබුණි. වර්ෂය ආරම්භයේ අවශ්‍යතාවය හදුනාගෙන ඒ අනුව ප්‍රසම්පාදනය සිදුනොකිරීම හේතුවෙන් 2022 වර්ෂයේ ලිපිද්‍රව්‍ය ප්‍රසම්පාදනයේදී රු. 7,209,040 ක අලාභයක් අරමුදලට සිදුවී තිබුණි. | තොග කලමනාකරණයට සුදුසු ගබඩා නොමැතිවීම, මුද්‍රණය කරනු ලබන පොත් පරිසර සංවේදී බැවින් කෙටිකාලීනව මුද්‍රණය කලයුතු වීම, ලැබෙන ආදායම කෙටිකාලීනව ආයෝජනය තුලින් අරමුදලට පොලී ආදායම් එකතු වීම වැනි කරුණු හේතුවෙන් මෙම ප්‍රසම්පාදන ක්‍රමය අනුගමනය කල බව. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුව කටයුතු කළ යුතුයි. |
| (ඇ) | ප්‍රසම්පාදනයන් කොටස් කිරීම | තොග කලමනාකරණයට | ප්‍රසම්පාදන |

| | | |
|---|---|---|
| අවශ්‍ය නම් එසේ කොටස් කිරිමට පෙර ඒ සදහා නිසි අධිකාරිය පවරනු ලැබූ ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතිය ලබාගත යුතු වුවත් එසේ අනුමැතිය ලබා ගැනීමකින් තොරව ප්‍රසම්පාදන වල අධිකාරී සීමාව දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවට සිමාවන පරිදි 2022 මැයි 23 සිට 2022දෙසැම්බර් 17 දක්වා කාලය තුල අවස්ථා 10 කට කොටස් කර රු මිලියන 69.8 ක ලිපිද්‍රව්‍ය ප්‍රසම්පාදනයන් සිදුකර තිබුණි. | සුදුසු ගබඩා නොමැතිවීම නිසා මෙම ප්‍රසම්පාදන ක්‍රමය අනුගමනය කල බව | මාර්ගෝපදේශ සංග්‍රහය අනුව කටයුතු කළ යුතුයි. |

## 3.2 නිශ්කාර්ය වියදම්

| විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| බැංකු පද්ධතිය සම්බන්ධව සියළු කරුණු චක්‍රලේඛ, අන්තර්ජාලය මගින් හා පනතේ දක්වා තිබියදී එම කරුණු පිළිබඳවම නිළධාරීන්ට බෙදාහැරීම සඳහා වර්ණවත් පිටු සහිතව කාටූන් පින්තූර යොදාගනිමින් අත්පොත් 3400 ක් මුද්‍රණය කිරිමට 2022 වර්ෂයේ රු.3,485,000 ක් වියදම් දරා තිබුණි. | සමෘද්ධි ප්‍රජාමූල බැංකු පිළිබඳව නිළධාරීන් ප්‍රජා නායකයින් හා භාහිර පාර්ශව වලට ප්‍රයෝජනයට ගත හැකි පරිදි අන්තර්ගතය පහසුවෙන් සහ ආකර්ෂණීය ලෙස අවබෝධ කරගත හැකි පරිදි මෙම අත්පොත නිර්මාණය කර බැංකු කළමණාකරණ මණ්ඩලයේ අනුමැතිය යටතේ මුද්‍රණය කර ඇති බව. | වියදම් දැරීමේ අවශ්‍යතාවය පිළිබඳ කළමනාකරණ මණ්ඩලයේ අවධානය යොමු කළ යුතුයි. |

## 3.3 නොවිසඳුන විගණන ඡේද

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව 2019 ජනවාරි 01 දින සිට 2019 දෙසැම්බර් 31 දක්වා වූ කාලපරිච්ඡේදයට අදාළව මා විසින් පාර්ලිමේන්තුවේ සභාගත කරන ලද වාර්තාවේ 3.2 ඡේදය යටතේ ඇතුළත් වූ පහත සඳහන් විගණන නිරීක්ෂණ සම්බන්ධව නිසි පියවර ගෙන නොතිබුණි.

| | නොවිසඳුන විගණන ඡේද | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ලංකා සළුසල ආයතනයට අයත් ගබඩාවේ ගබඩා කර තිබූ ලිපිද්‍රව්‍ය තොග 2010 වර්ෂයේදී ඉවත් කර ගෙන තිබූ නමුත්, ඒ සඳහා ගෙවූ රු. 1,454,112 ක් වූ ගබඩා කුලී තැන්පතුව ආපසු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | මෙම ආයතනය වෙත කිහිප වතාවක්ම ඉල්ලීම් කර ලිපි යවා ඇති බව | ලැබිය යුතු මුදල් අයකර ගැනිමට කටයුතු කල යුතුයි. |
| (ආ) | 2018 දෙසැම්බර් 31 දිනට ලිපිද්‍රව්‍ය මුද්‍රණය කිරිම වෙනුවෙන් රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවට ගෙවිය යුතු රු. 21,269,895 ක් වර්ෂ 04 කට අධික කාලයක් ගත වී ඇතත් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | ඉන්වොයිස් පත්‍ර රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවෙන් ඉදිරිපත් කර නොමැති බැවින් ගෙවීම් කිරීමට නොහැකි වී ඇති බව. | ශේෂ නිරවුල් කිරීමට කටයුතු කල යුතුයි. |

**4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

**4.1 අයවැය පාලනය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මුදල් රෙගුලාසි 877(1) ප්‍රකාරව සමාලෝචිත වර්ෂයන් සඳහා අරමුදලේ කටයුතු සම්බන්ධයෙන් අයවැය ලේඛන පිළියෙල කර නොතිබුණි. | මේ වන විට එවැනි ලේඛණයක් සකස් කර නොමැති අතර ඉදිරියේදී සකස් කර ලබාදීමට කටයුතු කරන බව. | මුදල් රෙගුලාසි හා චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව කටයුතු කල යුතුයි. |